# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.05.18 පැය 0815 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1010/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. වෙඩි තබා පුද්ගලයෙකුට හා කාන්තාවකට බරපතල තුවාල සිදුකිරීමේ අපරාධයක සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොටහේන පොලිස් ස්ථානය.**

2025.05.16 වන දින කොටහේන පොලිස් වසමේ සුමිත්‍රා මාවත ප්‍රදේශයේදී යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් පිස්තෝල අවියකින් වෙඩි තබා පුද්ගලයෙකුට හා කාන්තාවකට බරපතල තුවාල සිදුකිරීමේ අපරාධය සම්බන්ධයෙන් කොටහේන පොලිස් ස්ථානය මඟින් විමශර්න සිදු කරමින් පවතී.

මෙම අපරාධයෙන් පසු පලාගිය සැකකරුවෙකු හා අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු නීතිඥවරුන් මාගර්යෙන් 2025.05.17 වන දින කොටහේන පොලිස් ස්ථානයට හා කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයට වෙත භාරවීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 17 හා 18 වයස්වල පසුවන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

2025.05.18 වන අද දින සැකකරුවන් අළුත්කඩේ අංක 05 ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. කොටහේන පොලිසිය හා කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. නිවසක් බිඳ රන්භාණ්ඩ සොරාගත් සැකකරුවෙකු අත්අඩංගුවට - පෙරියනිලාවලි පොලිස් ස්ථානය.**

2025.05.16 වන දින පෙරියනිලාවලි පොලිස් ස්ථානයට වාතර්ා වූ නිවසක් බිඳ රුපියල් 1,624,000/- ක් වටිනා රන් භාණ්ඩ සොරකම් කිරීමේ අපරාධයක් සම්බන්ධයෙන් පෙරියනිලාවලි පොලිස් ස්ථානය මඟින් විමශර්න සිදුකර මෙම අපරාධය සිදුකළ සැකකරු 2025.05.17 වන දින දහවල් කාලයේ පෙරියනිලාවලි පොලිස් වසමේ මරදමුණ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 37 ක් වන මරදමුණ 03 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු විසින් සොරා ගන්නා ලද රන් වළලු 03 ක්, රන් බේස්ලට් 01 ක්, රන් කරාබු ජෝඩු 02 ක් හා රන් මුදු 02 ක් පොලිස් භාරයට ගෙන ඇත. පෙරියනිලාවලි පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**